සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

62 S I

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
# First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය : .......................................... පුරවැසි අධ්‍යාපනය - I කාලය : පැය 03යි.**

වැදගත් :

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

---

(1) ග්‍රීසියේ ''ඇතැන්ස්'' පෞර රාජ්‍යයේ පාලන කටයුතු සිදු කළේ කුමන ලක්ෂණ පදනම් කරගෙනදැයි පහත සඳහන් පිළිතුරුවලින් තෝරන්න.
1. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙනයි.
2. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙනයි.
3. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙනයි.
3. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙනයි.

(2) නියම කරන ලද වයස් සීමාව ඉක්ම වූ පුරවැසියන්ට කිසිදු භේදයකින් තොරව හිමි වන බලය,
1. පරමාධිපත්‍ය බලය ලෙස හැඳින් වේ.
2. සර්වජන ඡන්ද බලය ලෙස හැඳින් වේ.
3. ස්වාධිපත්‍ය බලය ලෙස හැඳින් වේ.
4. පරම බලය ලෙස හැඳින් වේ.

(3) එංගලන්තය, ප්‍රංශය, ඕලන්දය, පෘතුගාලය වැනි රටවල් ප්‍රබල ජාතික රාජ්‍යයන් ලෙස නැගී සිටීමට හේතු වූයේ,
1. ජාතික ඒකාග්‍රතාව හා දියුණු ආර්ථික තත්වය නිසා ය.
2. රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ හා යුධ ශක්තිය නිසා ය.
3. පුනරුදය හා නිර්මාණශීලි හැකියාව නිසා ය.
4. ජාතික ඒකාග්‍රතාවය හා පුනරුදය නිසා ය.

(4) මිනිසාට තම සමාජ ජීවිතය පරිපූර්ණ කර ගැනීම සඳහා සමාජයෙන් ලැබෙන හිමිකම් හඳුන්වන්නේ,
1. නිදහස යනුවෙනි.
2. අයිතිවාසිකම් යනුවෙනි.
3. සමානාත්මතාව යනුවෙනි.
3. යුක්තිය යනුවෙනි.

(5) ''රාජ්‍යයේ හෝ ජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්තිවලට හැරවීමත්, ඒවා ක්‍රියාවට නැංවීමත් කරනු ලබන නියෝජිතයා ආණ්ඩුව වේ''. මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?
1. J. R. ලවෙල් විසිනි.
2. ඇරිස්ටෝටල් විසිනි.
3. මහාචාර්ය ගානර් විසිනි.
4. P. D. H. කෝල් විසිනි.

6) මැතිවරණයක දී මහජනතාවට හිතකර ආණ්ඩුවක් බලයට පත්කර ගැනීමේ ක්‍රියාවලියේ දී වැදගත් ම කාර්භාරය පැවරෙන්නේ,
1. ඡන්ද දායකයන්ට ය.
2. රාජ්‍ය නායකයන්ට ය.
3. මහ ජනතාවට ය.
4. ආණ්ඩුවේ නායකයාට ය.

- **පහත සඳහන් ප්‍රකාශවලට අදාලව 7 සහ 8 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වේ.
B විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට සෘජුව බැඳී නැත.
C විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාවක් ඇත.
D ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සෘජු සම්බන්ධයක් පවතී.
E විධායක බලය හසුරුවන්නේ ජනාධිපති විසිනි.
F ව්‍යවස්ථාදායකයේ බලපෑමෙන් විධායකය නිදහස් වේ.

(7) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ABC
2. BCD
3. ADE
4. ACD



NWP EXAM

(8) ජනාධිපති ආණ්ඩුක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
1.. AED 2. BEF 3. DEF 4. ABE

(9) ''සෑම ආකාරයක ම අධිකාරී බලය එක් මධ්‍යම ආයතනයක් තුළ ඒකරාශී වී තිබේ නම් එය ඒකීය රාජ්‍යයන් වන බව'' ප්‍රකාශ කොට ඇත්තේ,
1. මහාචාර්ය ගානර් විසිනි. 2. හොබ් හවුස් විසිනි.
3. මහාචාර්ය හර්මන් J. ෆයිනර් විසිනි. 4. K. C. වියර් විසිනි.

(10) සන්ධීය රාජ්‍ය තුළ දැකිය හැකි නව ප්‍රවණතාවක් වන්නේ,
1. සාමාන්‍ය නීති සම්පාදනයේ දී ප්‍රාන්තවල කැමැත්ත ලබා ගැනීම.
2. මුළු රටට බලපාන ආර්ථික තීන්දු මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු විසින් ගැනීම.
3. රජය පනවන සුබ සාධක කාර්යවල වගකීම ප්‍රාන්ත රාජ්‍යවලට පැවරීම.
4. සන්නිවේදන හා ප්‍රවාහන සේවා තුළ සිදු වී ඇති අති නවීන දියුණුව නිසා සම්බන්ධීකරණය වේගවත් වීම.

(11) ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීමට බල පෑ ප්‍රධානතම විධි විධානය ඇතුලත් පිළිතුර තෝරන්න.
1. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13වන ව්‍යවස්ථා සංශෝධනය.
2. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17වන ව්‍යවස්ථා සංශෝධනය.
3. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18වන ව්‍යවස්ථා සංශෝධනය.
4. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19වන ව්‍යවස්ථා සංශෝධනය.

(12) සෑම පළාත් සභාවක ම මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වන්නේ,
1. මහ ඇමති ය. 2. ආණ්ඩුකාරවරයා ය. 3. අගමැතිවරයා ය. 4. ජනාධිපතිවරයා ය.

(13) බහු සංස්කෘතික සමාජයක ජීවත්වන පුරවැසියෙකු සතු වගකීම වන්නේ,
1. තමන්ගේ සංස්කෘතිය ඉස්මතු වන සේ කටයුතු කිරීම ය.
2. වැඩි පිරිසක් අයත්වන සංස්කෘතියට අනුගතව කටයුතු කිරීම ය.
3. විවිධ සංස්කෘතීන් මිශ්‍ර වීම වැළැක්වීමට කටයුතු කිරීම ය.
4. සියලු ම සංස්කෘතීන්ට ගරු කරමින් සමානව සැලකීම ය.

(14) රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපා ඇති හේතුවක් පහත සඳහන් පිළිතුරු අතරින් තෝරන්න.
1. අනවශ්‍ය ආකාරයට බලය මධ්‍යගත වීම. 2. රාජ්‍ය පාලනය කාර්යක්ෂම වීම.
3. රාජ්‍ය පාලකයින් වගකීමෙන් කටයුතු කිරීම. 4. නිලධාරිවාදය පිටු දැකීම.

(15) පුද්ගලයාගේ අවශ්‍යතා හා වුවමනා සෘජුව ඉටු කර ගැනීමට දායක කර ගන්නා භාණ්ඩ හඳුන්වන්නේ කුමන නමකින් ද?
1. අන්තර් භාණ්ඩ යනුවෙනි. 2. පාරිභෝජන භාණ්ඩ යනුවෙනි.
3. ප්‍රාග්ධන භාණ්ඩ යනුවෙනි. 4. කාර්මික භාණ්ඩ යනුවෙනි.

- **පහත සඳහන් ප්‍රකාශ ඇසුරින් 16 සහ 17 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A දේපළ අයිතිය රජය සතු වේ.
B ලාභය අරමුණු කරගෙන නිෂ්පාදනය කරයි.
C තරගකාරී වෙළඳපොලක් පවතියි.
D මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙයවයි.
E පොදු යහපත උදෙසා කටයුතු කරයි.
F ආදායම් විෂමතාවයක් පවතියි.

(16) සමාජවාදී අර්ථ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටක දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ABC 2. BCD 3. ADE 4. ADF

(17) ධනවාදී අර්ථ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටක දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.
1. BCD 2. BCF 3. CDF 4. DEF

(18) වෙළෙඳපොල මගින් මුදල් මාධ්‍ය කොට ගෙන භාණ්ඩ හුවමාරු කර ගැනීමක් සිදු වේ. මෙම ක්‍රියාවලිය හඳුන්වන්නේ,
1. බෙදා හැරීම නමිනි. 2. වෙළඳාම නමිනි.
3. පරිභෝජනය නමිනි. 4. නිෂ්පාදනය නමිනි.

NWP EXAM

(19) පරිවර්තන ආර්ථිකයක් තුළ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
1. රාජ්‍ය ව්‍යවසායකයන් දිරි ගැන්වීම. 2. මිල පාලන නීති ඇති කිරීම.
3. පෞද්ගලික ව්‍යවසායකයන් දිරි ගැන්වීම. 4. ආර්ථික කටයුතුවලට රජය උපරිම ලෙස මැදිහත් වීම.

(20) 1977න් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ දක්නට ලැබුණු ලක්ෂණයක් වන්නේ,
1. විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම. 2. ආනයන ආදේශන කර්මාන්ත ඇරඹීම.
3. ආනයනය සඳහා සීමා පැනවීම. 4. සලාක ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

(21) තිරසර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණක් වන්නේ මින් කුමක් ද?
1. අනාගත පරම්පරාව සමග ඒකමතික නොවීම.
2. ජනතා සහභාගිත්වය අඩු කර ගැනීම.
3. පරිසරයේ ආරක්ෂාව තර කිරීම.
4. අන්‍ය සංස්කෘතීන් හෙළා දැකීම.

(22) දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුමෙහි (SAPTA) ප්‍රධානතම අරමුණ ඇතුළත් පිළිතුර තෝරන්න.
1. මූල්‍ය ගනුදෙනු වඩා ක්‍රමවත් කිරීම. 2. නිර්බාධ වෙළඳාම ව්‍යාප්ත කිරීම.
3. කලාපීය වෙළඳාම පුළුල් කිරීම. 4. රාජ්‍ය නොවන සංවිධාන දිරි ගැන්වීම.

(23) ගෝලීයකරණය ශ්‍රී ලංකාවට කරන ධනාත්මක බලපෑමක් වන්නේ,
1. ආර්ථිකය විවිධාංගීකරණය වීම.
2. අකාර්යක්ෂම කර්මාන්ත වෙළඳපොළෙන් ඉවත් වීම.
3. සේවා වියුක්තිය වැඩි වීම.
4. දේශීය නිෂ්පාදන සාධකවලට ඇති ඉල්ලුම අඩු වීම.

(24) අන්තර් භාණ්ඩ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. යන්ත්‍ර සූත්‍ර හා පොහොර 2. ගොඩනැගිලි හා වාහන.
3. පොහොර සහ දව. 4. ඖෂධ හා දව.

(25) ජොහාන් ගැල්ටුන් විසින් ඉදිරිපත් කරන ලද ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියේ අවස්ථා දක්වෙන පිළිතුර තෝරන්න.
1. ආතතිය, සන්දර්භය, චර්යාව. 2. ආකල්ප, චර්යාව, සන්දර්භය
3. කලහකාරීත්වය, චර්යාව, ආතතිය. 4. ආකල්ප, චර්යාව, ආතතිය.

(26) සාර්ව ගැටුමක් වන්නේ,
1. පවුල් අතර ඇතිවන ගැටුම් ය. 2. පුද්ගලයින් අතර ඇතිවන ගැටුම් ය.
3. පුද්ගලයා තුළ ඇතිවන ගැටුම් ය. 4. ජනවර්ග අතර ඇතිවන ගැටුම් ය.

(27) ගැටුම් විසඳීම සඳහා යොදාගනු ලබන විනිසීමේ ක්‍රියාවලියේ ලක්ෂණයක් වන්නේ,
1. හරස් ප්‍රශ්න ඇසීම සඳහා අයිතියක් නැත.
2. අභියාචනා ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.
3. අධිකරණය විසින් දෙනු ලබන තීන්දුව අවසන් තීරණය නොවේ.
4. නඩුවෙන් දිනන පාර්ශවය නඩු ගාස්තු ගෙවිය යුතු ය.

- **පහත දක්වෙන කරුණු අතරින් බේරුම් කිරීම සඳහා යොදා ගත හැකි අවස්ථා ඇතුළත් පිළිතුර තෝරන්න.**

A මුදල් පිළිබඳ ආරවුල්.
B විනය පරීක්ෂණ.
C පවුල් ආරවුල්.
D සේවක ගැටුම්.
E පෞද්ගලික ගැටුම්.

(28) 1. ABC 2. ABD 3. ACE 4. BCE

(29) ගැටුම් නිරාකරණය සඳහා පුද්ගලයෙකු සතු විය යුතු පුද්ගල ගුණාංග පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
1. ඉවසීම, සංවේදී බව, මුදිතාව. 2. පරිත්‍යාගශීලී වීම, යුතුකම් ඉටු කිරීම, ඉවසීම.
3. දරා ගැනීමේ ශක්තිය, සහානුභූතිය, මුදිතාව. 4. ආත්මාවබෝධය, සාධාරණත්වය, සවන් දීම.

(30) ගැටුම් සාමකාමීව විසඳා ගැනීමේ වාසියක් වන්නේ,
1. දේශපාලන අස්ථාවරත්වයක් ඇති වීමයි. 2. මානසික ආතතිය උග්‍ර වීමයි.
3. ජාතික ඒකාබද්ධතාවය ඇති වීමයි. 4. ආර්ථිකය බිඳ වැටීමයි.

NWP EXAM

(31) නීතිය තුළ අන්තර්ගත විය යුතු ගුණාංගයක් දක්වෙන පිළිතුර තෝරන්න.
1. වෙනස්වන සමාජ අවශ්‍යතා අනුව වෙනස් නොවීම.
2. පෞද්ගලික යහපත අරමුණු කොට ගෙන පැනවීම.
3. සාධාරණ හා අයුක්ති සහගත වීම.
4. නීති කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම.

(32) නීතිය ක්‍රියාත්මක වන සමාජයක් තුළ දැකිය හැකි ලක්ෂණයන් වන්නේ,
1. එමගින් යුක්ති ගරුක අසාධාරණ සමාජයක් බිහි වේ.
2. නීතිය කෙරෙහි විශ්වාසය තහවුරු වේ.
3. නීතිය සමාජයට පහළින් පවතී.
4. නීතිය නිතර නිතර වෙනස් වේ.

- **සමාජයේ මිනිසුන් විසින් සිදු කරනු ලබන පහත සඳහන් වැරදි ඇසුරෙන් 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A මිනී මැරුම්
B විවාහ සම්බන්ධ ගැටලු.
C ළමා අපචාර.
D මත්ද්‍රව්‍ය විකිණීම.
E උරුමයන් සම්බන්ධ ගැටලු.
F දරුවන්ගේ අයිතිවාසිකම් ලබා නොදීම.

(33) අපරාධ නීතියට අයත්වන වැරදි ඇතුලත් පිළිතුර වන්නේ,
1. ABC 2. ACD 3. BCD 4. CDE

(34) සිවිල් නීතියට අයත්වන වැරදි ඇතුලත් පිළිතුර තෝරන්න.
1. ABD 2. ADE 3. DEF 4. BEF

(35) ශ්‍රී ලංකාවේ අවසාන හා ඉහළ ම අභියාචනාධිකරණ බලය සහිත අධිකරණ ආයතනය වන්නේ,
1. අභියාචනාධිකරණයයි. 2. මහාධිකරණයයි.
3. ශ්‍රේෂ්ඨාධිකරණයයි. 4. දිසා අධිකරණයයි.

(36) පළාත්බද මහාධිකරණය සඳහා විනිශ්චයකාරවරුන් පත් කරන්නේ කවුරුන් විසින් ද?
1. ජනාධිපති විසිනි. 2. අග්‍ර විනිශ්චයකාරවරයා විසිනි.
3. මහ ඇමති විසිනි. 4. ආණ්ඩුකාරවරයා විසිනි.

(37) නීතියේ ආධිපත්‍ය යන්නෙන් අදහස් කරන්නේ,
1. රටක මානව හිමිකම් ආරක්ෂා කිරීමට ඇති අයිතිය.
2. මානව හිමිකම් කඩ වූ විට දඬුවම් කිරීමට ඇති අයිතිය.
3. රටක පාලන නීතියේ උත්තරීතර භාවයට අනුව සිදු කිරීමට ඇති හැකියාවයි.
4. රටේ සිටින සියලු ම පුරවැසියන්ට නීතියට එක සමාන ලෙස ක්‍රියාත්මක වීම වැළැක්වීමයි.

(38) මානව හිමිකම් කොමිෂමට ජනාධිපති විසින් පත් කරනු ලබන සාමාජිකයින් ගණන වන්නේ,
1. 20කි. 2. 10කි. 3. 12කි. 4. 25කි.

(39) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කොට ඇති ප්‍රතිපාදනයක් වන්නේ,
1. විනිශ්චයකාරවරුන්ගේ වැටුප් අඩු කිරීමයි.
2. විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීමයි.
3. අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීමයි.
4. අධිකරණ කටයුතුවලට බලපෑම් කිරීමට විධායකයට හැකියාව පැවතීමයි.

(40) අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා ඇතිවිය හැකි අවාසිදායක තත්වයක් පහත පිළිතුරුවලින් තෝරන්න.
1. මිනිසුන් තුළ අධිකරණය පිළිබඳව ගෞරවයක් ඇති වීම.
2. යුක්තිය ඉටු කර ගැනීමට අනියම් ක්‍රම භාවිත කිරීමෙන් වැලකීම.
3. අල්ලස හා දූෂණය රට තුළ වර්ධනය වීම අඩාල වීම.
4. රට තුළ සර්ව සාධාරණත්වය පිරිහීමට ලක් වීම.

NWP EXAM

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

62 | S | II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය : ........................................ පුරවැසි අධ්‍යාපනය - II**

වැදගත් :

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

---

01. (i) රටක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
(ii) ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු සතු විය යුතු වැදගත් ගුණාංග දෙකක් ලියන්න.
(iii) නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු දෙකක් ලියන්න.
(iv) ඒකීය රාජ්‍යයන් දෙකක් නම් කරන්න.
(v) බහු සංස්කෘතික සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.
(vi) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා ශිල්පීය ක්‍රම 2ක් නම් කරන්න.
(vii) වෙළඳපොල ආර්ථිකයන්හි විවිධ ස්වරූප දෙකක් ලියන්න.
(viii) අන්තර් ජාතික ගැටුම් බෙදා දැක්විය හැකි කොටස් දෙක ලියන්න.
(ix) නීතියේ මූලාශ්‍ර දෙකක් ලියන්න.
(x) A- අධිකරණ සේවා කොමිසමේ නිල කාලය කොපමණ ද?
B- එහි සාමාජිකයින් ගණන කොපමණ ද? (ලකුණු 02 × 10 = 20)

''රටක පුරවැසියන් අයිතිවාසිකම් බුක්ති විඳින අතර ඒ හා බැඳුණු යුතුකම් සමාජය වෙත ඉටු කිරීම ද පුරවැසියන් සතු වගකීමක් වේ.''

02. (i) යුතුකම් බෙදා දැක්විය හැකි ආකාර දෙක ලියන්න. (ලකුණු 02)
(ii) නීතිමය යුතුකම් තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) ආණ්ඩුවක් තම පාලන කටයුතු පවත්වාගෙන යාමේ දී ජන සමාජයට ඉටු විය යුතු වගකීම් තුනක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

''බලයෙහි අවසාන හිමිකරුවා වන්නේ ජනතාව වන අතර ජනතාව සතු එම බලය පරමාධිපත්‍ය බලය ලෙස හඳුන්වයි.''

03. (i) පරමාධිපත්‍ය බලයට අයත්වන මූලික අංග දෙකක් ලියන්න. (ලකුණු 02)
(ii) බලයෙහි විවිධ ස්වරූප තුනක් නම් කරන්න. (ලකුණු 03)
(iii) ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සඳහා වර්තමානයේ පිහිටුවා ඇති පළාත් පාලන ආයතන වර්ග තුන නම් කොට එකක් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 05)

''ආර්ථික වර්ධනය යනු මූර්ත ජාතික නිෂ්පානයේ වසරින් වසර සිදුවන වැඩි වීමේ ප්‍රතිශතයයි.''

04. (i) පුද්ගල හා සමාජ පූර්ණ සංවර්ධනය සඳහා සලකා බැලිය යුතු අංශ දෙකක් ලියන්න. (ලකුණු 02)
(ii) වර්තමානයේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදු කරන ලද වෙනස්කම් තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) දැනට සිදුවෙන සංවර්ධන ක්‍රියා නිසා ශ්‍රී ලංකාවට අත්වන වාසි තුනක් ලියා ඉන් එකක් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 05)

NWP EXAM

''වර්තමානයේ ලෝක මට්ටමින් සිදුවන මහා සංග්‍රාම නොමැති වුව ද රටවල් අතර පවතින යුද්ධ රැසක් අද දක්වාම පවතී.''

05. (i) වර්තමානයේ දක්නට ලැබෙන එවන් යුධ තත්ව දෙකක් ලියන්න. (ලකුණු 02)
(ii) ගැටුම් ඇතිවන මූල තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) ගැටුම් ඇති වීමට මනස මුල් වන නිසා මනසේ සාමය ඇති කිරීම සඳහා යොමු විය හැකි අංශ තුනක් ලියා එකක් විස්තර කරන්න. (ලකුණු 05)

''නීතියට ගරු කිරීම හා අවනත වීම රටක පුරවැසියන්ගේ වගකීමකි.''

06. (i) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව එය කොටස් දෙකකි. එම කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)
(ii) වර්තමානයේ අන්තර්ජාතික නීතිය ඇසුරෙන් පැන නැගුණ නීති ශාඛා තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) දේශීය නීතියේ ප්‍රභේද තුන නම් කොට ඉන් එකක් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 05)

''වර්තමාන සමාජය තුළ අධිකරණයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ.''

07. (i) ශ්‍රේෂ්ඨාධිකරණ සතු බලතල දෙකක් ලියන්න. (ලකුණු 02)
(ii) ශ්‍රී ලංකාව තුළ විශේෂ පාර්ලිමේන්තු පනත් මගින් පිහිටුවා ඇති අධිකරණ ආයතන තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) ආරවුල් බේරුම් කිරීමේ විකල්ප ක්‍රම තුනක් ලියා ඉන් එකක් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 05)

NWP EXAM